www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2005 මැයි දිනය: දෙවැනි ලෝක සංග්‍රාමය අවසානයේ සිට හැට වසරක්

**May day 2005: sixty years since the end of world war ii**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2005 මැයි 2**

### පලමු කොටස

*අප්‍රේල් 30 වැනි දින බර්ලින් හි දී පැවති මැයි දින රැස්වීමට ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයෙහි සභාපති හා එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් ඩේවිඩ් නෝර්ත් විසින් ඉදිරිපත් කල වාර්තාවේ පලමු කොටස පහත පලකෙරේ.*

අද දින සැමරෙන මැයි දිනය අවශ්‍යයෙන්ම සුවිශේෂී වැදගත්කමක් අත්කර ගන්නේ හරියට ම මීට හැට වසරකට පෙර බර්ලින් නගරයෙහි ඇති වූ සිද්ධීන් සිහියට නගාගැනීමෙන් තොරව මෙම නගරයෙහි රැස්වීමට අපට නොපුලුවන් බැවිනි. 1933ට ප්‍රථමයෙන් කලාව හා විද්‍යාව පිලිබඳව ලෝක ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ මධ්‍යස්ථාන අතුරෙන් එකක් වූ බර්ලිනය, මරනයේ ද විනාශයේ ද බිහිසුනු ගිනිමැලයක් බවට පත් කරනු ලැබින. 1945 අප්‍රේල් මස අවසන් දින දහය තුල හිට්ලර්ගේ ''දහස් වසරක රීචය'' සෝවියට් හමුදාවන්ට එරෙහි අවසන් සටනට මුහුන දුන් අතර සිවිල් වැසියන් හා සොල්දාදුවන් දෙලක්ෂ පනස් දහසක් බර්ලිනයේ දී මරුමුවට පත් විය.

කෲරත්වයේ අසමසම පාලන තන්ත්‍රයක් අඩු හෝ වැඩි වසයෙන් අවසානයකට ගෙන එමින් 1945 අප්‍රේල් මස 30 දින හිට්ලර් සියදිවි නසා ගත්තේ ය. මැයි දින හිමිදිරිය ලඟා වෙද්දී නගරයේ පාලනය සෝවියට් හමුදා අතට පත් විය. සතියකට පසුව 1945 මැයි 8 වැනි දින, ඉතිරිව සිටි ජර්මානු හමුදා මන්ඩලය යටත් වීමේ ලියවිලි අත්සන් තැබූ අතර 1939 සැප්තැම්බරයේ දී ආරම්භ වූ යුරෝපයේ යුද්ධය නිමාවට පත් විය.

එහෙත් ලෝක ඛේදවාචකයේ අවසාන ක්‍රියාවලිය තවමත් නිමාවකට පැමිනිය යුතුව තිබුනි. ආසියාවේ යුද්ධය තවත් තෙමසක් පුරා පැවතුනි. අවසානයේ දී 1945 අගෝස්තු 6 වන දින එක්සත් ජනපදය කිසිදු සුවිශේෂී මිලිටරි වැදගත්කමක් නො තිබුනු හිරෝෂිමා නගරයට පරමානු බෝම්බයක් හෙලී ය. තෙදිනකට පසුව දෙවැනි පරමානු බෝම්බය නාගසාකි වෙතට හෙලී ය. න්‍යෂ්ටික බෝම්බ දෙක දල වසයෙන් දෙලක්ෂ පනස් දහසක් මිනිසුන් එක්කෝ මරාදමුනු හෝ නැතහොත් වේදනාකාරී තුවාලකරුවන් බවට පත් කලේ ය. ආසියාවේ ජනතාවට එරෙහිව සිදුකල දැවැන්ත අපරාධයන්ට ජපන් අධිරාජ්‍ය ආන්ඩුව වරදකරු ය යන කරුන සම්බන්ධයෙන් මතභේදයක් නොමැත. එසේ වුවද ජපන් නගර දෙකක් මත පරමානු බෝම්බ හෙලීමට ගත් තීරනය තම පැයක නින්දටවත් බාධාවක් නොකල බව ජනාධිපති ට්‍රෲමන් සතුටින් ප්‍රකාශ කල ද එය ම්ලේච්ඡ ක්‍රියාවක් විය. වසර ගනනාවකට පසුව ඇමරිකානු ඉතිහාසඥ ගේබ්‍රියෙල් ජැක්සන් ලිවූ පරිදි ''1945 අගෝස්තුවේ දී පැවති සුවිශේෂ තත්වය තුල පරමානු බෝම්බය යොදා ගැනීම පෙන්නුම් කලේ මානසිකව ඉතාමත් සාමාන්‍ය තත්වයෙන් යුතු හා ප්‍රජාතන්ත්‍රවාදීව තෝරා පත් කරගත් ප්‍රධාන විධායකයාට එම අවිය නාසි ආඥාදායකයා විසින් යොදාගත හැකිව තිබුනු ආකාරයෙන් ම යොදාගැනීමට හැකි වූ බවයි. මේ ආකාරයට එක්සත් ජනපදය - විවිධ මාදිලියේ ආන්ඩුවල හැසිරීමේ සදාචාරාත්මක විශිෂ්ටත්වය ගැන උනන්දුවන යමෙක් - ප්‍රජාතන්ත්‍රවාදය හා ෆැසිස්ට්වාදය අතර වෙනස අකා මකා දැමී ය. [1]

දශක හයක කාලසීමාවකට පසුව වුවත් යුද්ධයෙන් ඇති කල භීෂනය හා වේදනාවන්ගේ පරිමාව අවබෝධ කර ගැනීම මුලුමනින් ම පාහේ නො කල හැකි දෙයක් බවට පත්ව තිබේ. දෙවැනි ලෝක සංග්‍රාමය අවධියේ මරාදැමුනු මිනිසුන්ගේ මුලු ගනන හැත්තෑ මිලියනයක් හෝ ඊටත් වඩා වැඩි විය හැකි ය. මෙය කිසිවෙකුත් හරියට ම නො දනී. නාසි තන්ත්‍රය හා එහි හවුල්කරුවන් යුරෝපීය යුදෙව්වන් හය මිලියනයක් ඝාතනය කල බව අපි දන්නෙමු. තවත් තුන් මිලියනයක යුදෙව් නො වන පෝලන්ත වැසියන් මරා දැමුනි. දල වසයෙන් මිලියන 25ක සෝවියට් සොල්දාදුවන් හා සිවිල් වැසියන් ඝාතනය කරනු ලැබින. දසලක්ෂ පහලොවක් චීන වැසියන්ගේ ජීවිත අහිමි විය. ජර්මානුවන් දසලක්ෂ හයක් හා එපමන ම සංඛ්‍යාවක් ජපන් වැසියන් ද මරා දැමුනි. තවත් මිලියන දෙකක් යුගෝස්ලාවි වාසීන් වැනසී ගියේ ය.

දෙවැනි ලෝක සංග්‍රාමයේ අවසානය පැමිනි විට මෙම සංහාරය අත් දුටු ජනතාව අතර පැවති හැඟීම කෝපය හා බලාපොරොත්තුව අතර පැද්දෙමින් තිබුනි. ලොව පුරා මිලියන ගනනක් කම්කරුවන්ගේ ඇස් පනාපිට ධනවාදය ප්‍රගාඪ ලෙස අපකීර්තියට පත්ව තිබුනි. වචනයෙන් කිව හොත් ඒ සමග ඇදී ගියේ සාපරාධීත්වයේ දුර්ගන්ධය යි. අධිරාජ්‍යවාදයේ, යටත්විජිතවාදයේ, ෆැසිස්ට්වාදයේ හා යුද්ධයේ බිහිසුනුකමට වග කිවයුතු සමාජක්‍රමයට එරෙහිව දැඩි කෝපයක් පැතිර පැවතුනි. යුද්ධයෙන් පසු කාලයේ දී ලෝකය ප්‍රතිසංවර්ධනය හා ප්‍රතිසංවිධානය වඩාත් මානුෂිකවාදී, ප්‍රජාතන්ත්‍රවාදී හා සමානාත්මතා - කෙටියෙන් කිව හොත් සමාජවාදී- පදනමක සිදු විය යුතුය යන බලාපොරොත්තුව පැවතියේ ය.

ධනවාදයට එරෙහිව පැවති ජනතාවගේ පිලිකුල තියුනු ලෙස සැලකිල්ලට ගනිමින්, ජනාධිපති ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් යුද්ධයෙන් යහපත් හා වඩාත් සාධාරන ලෝකයක් නැගී එනු ඇතැයි ඇමරිකානු ජනතාවට සහතික විය.

''අපගේ ජනතාව ඔවුන්ගේ දේශපාලන හා ආර්ථික ක්‍රමයන්ගෙන් බලාපොරොත්තුවන මූලික දේ සරල ය. ඒවා මෙසේ ය.

''යෞවනයන්ටත් අනෙකුත් අයටත් සමාන වූ අවස්ථාවත්,''

''වැඩ කලහැකි සැමට රැකියාවත්''

''අවශ්‍ය සියල්ලන්ට ආරක්ෂාව

''අතලොස්සකට විශේෂ වරප්‍රසාදිත තත්වය අහෝසිවීම''

''සියල්ලන්ගේ සිවිල් නිදහස සුරැකීම

''පුලුල්ව හා නිරතුරුව ඉහල නැගෙන ජීවන තත්වයන් තුල විද්‍යාවේ ප්‍රගමනයෙහි පල ප්‍රයෝජන භුක්ති විඳීම.''

''අපගේ නූතන ලෝකයෙහි ඇදහිය නො හැකි සංකීර්නතාවය ද, කලබැගෑනිය ද තුල කිසිසේත් දැස් ඉවතට නො ගත යුතු මූලික හා සරල දෑ මේවා ය. අපගේ ආර්ථික හා දේශපාලන ක්‍රමයන්හි ඇතුලත දරා සිටින ශක්තිය රඳා පවතින්නේ එමගින් ඉහත අපේක්ෂාවන් ඉටුකරනු ලබන තරමට ය.''

ධනේශ්වර ක්‍රමය විනිශ්චය කල යුතු මිම්ම ජනාධිපති රූස්වෙල්ට්ගේ මෙම පොරොන්දුව ලෙස සලකන්නේ නම් දෙවැනි ලෝක සංග්‍රාමය අවසන්වීමෙන් හැට වසරකට පසුව ඉතිහාසය ඒ පිලිබඳව දියයුතු තීන්දුව කුමක් ද? ලෝකයේ ධනවත්ම හා බලවත්ම ධනේශ්වර රාජ්‍යය වන එක්සත් ජනපදය තුල මෙම ''සරල'' හා ''මූලික දේවල්'' වලින් ඉටු වී ඇත්තේ කුමන දේ ද?

අනෙකුත් සම්බන්ධයෙන් කෙසේවෙතත් යෞවනයන් සම්බන්ධයෙන් හෝ සමාන වූ අවස්ථාවන් තිබේ ද? ධනවත් ම උප නාගරිකයන් හි හැරෙන්නට එක්සත් ජනපදය පුරාම පොදු අධ්‍යාපන ක්‍රමය පවතින්නේ බිඳවැටීමේ තත්වයක ය. රට පුරාම ප්‍රධාන නගරයන්හි දහස් ගනන් පාඨශාලා අරමුදල් හිඟය නිසා වසා දමමින් තිබේ. නිල දරිද්‍රතා රේඛාවෙන් පහල ජීවත්වන මිලියන 35ක ඇමරිකානුවන්ගෙන් සියයට හතලිහක් ම ලමුන් ය.

වැඩ කල හැකි අයට රැකියාවක් ගැන කෙසේ ද? එක්සත් ජනපදයේ නිල විරැකියා අනුපාතය සියයට පහත් හයත් අතර ය. එහෙත් මෙම සංඛ්‍යාවන්ට එක්කෝ ඌන සේවා නියුක්තිකයන් හෝ රැකියා සෙවීම අතහැර දමා ඇති මිලියන ගනනක් ඇතුලත් නො වේ. සිරගත කොට ඇති මිලියන දෙකක් වන ඇමරිකානුවන් ද ඊට ඇතුලත් නො වේ. තමන් කලින් නිරතව සිටි රැකියාවන් අහෝසි කිරීමෙන් පසුව අඩු වැටුප් සහිත රැකියාවල යෙදීමට බලකෙරී ඇති මිලියන ගනනක් ඇමරිකානු කම්කරුවන්ට ලබාගත හැකි රැකියාවල ගුනාත්මක භාවය ගැන හෝ ඉන් එලියක් නො විහිදුවයි. ''අවශ්‍ය සියල්ලන්ටම ආරක්ෂාව'' යන පොරොන්දුව ගැන සලකන්නේ නම් ඇමරිකානු ජන ජීවිතයේ සියල්ලටම ඉහලින් ඇති යථාර්ථය වනාහි කම්කරු ජනතාවගෙන් අති බහුතරයක් තමන්ට පාලනයක් නොමැති ආර්ථික බලවේගයන්ගේ අනුකම්පාව මත නිරන්තර අනාරක්ෂිත තත්වයෙන් ජීවත් වන බවයි.

එක්සත් ජනපදයේ පවත්නා වූ පන්ති සම්බන්ධතාවන් ''අතලොස්සක් දෙනා සඳහා සඳහා විශේෂ වරප්‍රසාද'' අවසන් කරන බවට රූස්වෙල්ට් දුන් පොරොන්දුව පිලිබඳ කටුක සමච්චලයකි. ජනගහනයෙන් සියයට එකකටත් අඩු සංඛ්‍යාවක් ජාතික ධනයෙන් අඩකටත් වැඩි කොටසක් සැබවින්ම පාලනය කරන්නා වූ එක්සත් ජනපදය ධනේශ්වර රටවල් අතුරෙන් වඩාත් ම අසමාන වූ රාජ්‍යයයි. සිය සමාගම්වල සේවයේ නියුතු කම්කරුවන්ට ගෙවනවාට වඩා හාරසිය ගුනයනටත් වැඩි සාමාන්‍ය ආදායමක් සංගත වංශවතුන් තුනී තට්ටුවක් විසින් උපයාගනිති.

සිවිල් නිදහස පිලිබඳව සලකන්නේ නම් එය එක්සත් ජනපදය තුල පෙර නොවූ විරූ ප්‍රහාරයකට ලක්ව තිබේ. ව්‍යවස්ථාව අභිබවා යමින් පුරවැසියන් අත් අඩංගුවට ගෙන ඔවුන් සිදුකර ඇතැයි සැලකෙන අපරාධය කුමක් දැයි ඔවුන්ට දැනුම්දීමකින් හෝ එසේ අත් අඩංගුවට ගෙන තිබෙන සැකකරුවන්ට නීතිඥ සහාය ලබාදීමකින් හෝ තොරව අනියත කාලයක් ඔවුන් සිරකොට තැබීමට තමන්ට බලය ඇතැයි බුෂ් පරිපාලනය කියා සිටියි. ජිනීවා සම්මුතීන් ද ඇතුලත් ජාත්‍යන්තර නීති නියාමයන් අවඥාවෙන් බැහැර කරමින් බුෂ් පාලනාධිකාරය ප්‍රශ්න කිරීමේ නීත්‍යානුකූල

උපාංගයක් ලෙස වධයට ලක් කිරීමට අනුමැතිය පලකර තිබේ.

අවසන් වසයෙන් ''පුලුල් හා නිරතුරුව ඉහල නගින ජීවන තත්වයන් තුල විද්‍යාත්මක ප්‍රගමනයේ පලප්‍රයෝජන භුක්තිවිඳීම'' 2005 වසරේ එක්සත් ජනපදය තුල කල නො හැකි දෙයකි. පසුගිය දශක තුන තුල ඇමරිකානුවන් අති බහුතරයකගේ ජීවන තත්වයන් පහල වැටෙමින් තිබේ. රාජ්‍යය හා නව ෆැසිස්ට්වාදී ක්‍රිස්තියානි මූලධර්මවාදීන්ගේ කන්ඩායම් අතර පවතින සන්ධානය පරිනාමවාදයේ න්‍යායික ඉගැන්වීම් තහනම් කිරීමටත්, බයිබලයේ ආදානග්‍රාහයන් හා ගැටෙන විද්‍යාත්මක ගවේශනයේ අංශයන් මුලුමනින් ම තහනම් කල නො හැකි නම් සීමා කිරීමට හෝ තැත් කරන අතර විද්‍යාවේ ම ගෙල සිර කර තිබේ.

ජනාධිපති ප්‍රකාශ කලා වූ ''බියෙන් තොර නිදහස'' ඔහුගේ ම වචනවලින් උපුටා දක්වන්නේ නම් ''එහි අර්ථය වන්නේ අසල්වැසියාට එරෙහිව ලොව කොතැනක හෝ ආක්‍රමනශීලී කඩාවැදීමකට කුමන ජාතියකට හෝ ඉඩක් නොලැබෙන පූර්න රටාවකට හා එවන් සීමාවන් දක්වා ලොව පුරා යුද්ධායුද සීමාකිරීමට සහතික වන''පශ්චාත් යුදකාලීන ලෝකයක් ද රූස්වෙල්ට් පොරොන්දු විය. ''එය ඈත සහස්‍රයක දැක්මක් නො වේ. ඒ වනාහී අපගේ ම පරම්පරාව හා කාලය තුල සාක්ෂාත් කර ගත හැකි වර්ගයේ ලෝකයක් සඳහා වූ නිශ්චිත පදනමකි.''

යුද්ධායුධ සීමාකිරීමත්, රාජ්‍ය ප්‍රතිපත්තියේ උපාංගයක් ලෙස ආක්‍රමනකාරීත්වය අතහැර දැමීමත් පදනම් කර ගත් සාමකාමී හා නීතිගරුක ලෝක පර්යායක් ගොඩනැගීම සඳහා වූ මෙම සහතික වීමේ යමක් වේ නම්, ධනවාදී පදනමක් මත ප්‍රජාතන්ත්‍රවාදී හා වඩාත් සමානාත්මතාවෙන් යුත් සමාජයක් ගොඩනැංවීමේ රූස්වෙල්ට්ගේ ජාතික ක්‍රියාමාර්ගයටත් වඩා බලගතු ලෙස එය අසාර්ථක වී තිබේ. ජාත්‍යන්තර අරමුනු මුදුන්පත් කර ගැනීමේ මාධ්‍යයක් ලෙස ආක්‍රමනකාරී යුද්ධය යොදාගැනීම - දෙවැනි ලෝක සංග්‍රාමයෙන් පසුව නාසි නායකයන් එල්ලා මැරීමට හේතු වූ ප්‍රධාන අපරාධය - බුෂ් පාලනාධිකාරයේ පූර්ව භංග යුද්ධ ධර්මතාවයේ රූපයෙන් එක්සත් ජනපදය විසින් වැලඳගෙන තිබේ.

එහෙත් ඇමරිකානු අධිරාජ්‍යවාදය රික්තයක් තුල පවතිනවා නො වේ. එක්සත් ජනපදයේ මංකොල්ලකාරී ප්‍රතිපත්ති නියෝජනය කරන්නේ, එහි ම භූගෝලීය ආධිපත්‍යයේ උද්‍යත පාඨය යටතේ ඓතිහාසිකව යල් පැනගිය ජාතික රාජ්‍ය ක්‍රමය හා ලෝක ආර්ථිකයක වැඩී යාම අතර නොවැලැක්විය හැකි ප්‍රතිසතිතාවයෙන් උත්පාදනය කරන ගැටුම් පාලනය කිරීමේ ප්‍රතිගාමී උත්සාහය යි. අද දින පවතින ජාත්‍යන්තර ආතතියේ මට්ටම දෙවැනි ලෝක සංග්‍රාමය ආසන්නයේ පැවතුනාට නොදෙවෙනි ය. යුද්ධායුධවලින් පිරී ඉතිරී යන ලොවෙහි මූලෝපායිකව වැදගත් අමුද්‍රව්‍ය කරා ද, ලාභ ශ්‍රම මූලාශ්‍රයන් කරා ද, අනෙකුත් අපමන භූ දේශපානික හා ආර්ථික ප්‍රතිලාභ කරා ද ලඟා වීම සඳහා ජීවිතයත් මරනයත් අතර අරගලයන් තුල ජාතීන් තරග වැද සිටින අතර ලෝකයේ කොතැනක හෝ ඇතිවන ගැටුමක් ලෝකය ම වෙලා ගත් සංග්‍රාමයක් කරා විහිද යා හැකි ය.

2003 මාර්තු මාසයේ දී එක්සත් ජනපදය විසින් සිදු කල ඉරාක ආක්‍රමනය දෙවැනි ලෝක යුද්ධාවසානයේ පටන් ජාත්‍යන්තර සබඳතා හසුරුවනු ලැබූ රාජ්‍යතාන්ත්‍රික නීතිමය හා ව්‍යූහාත්මක රාමුවේ බිඳවැටීම වේගවත් කර තිබේ. මෙම ක්‍රියාවලිය ආරම්භ වූයේ 1991 දී සෝවියට් සංගමය විසුරුවා හැරීමත් සමග ය. සෝවියට් සංගමය සමග පැවති සීතල යුද සමයේ එක්සත් ජනපද අවශ්‍යතාවන්ට සේවය කල ජාත්‍යන්තර සංවිධානයන් හා ආයතන එහි නව භූගෝලීය අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමේ දී බාධකයක් ලෙස වොෂින්ටනය විසින් දැකගනු ලබයි.

මෙහි ප්‍රථම හා පහර එල්ල වූයේ වඩාත් ප්‍රබල පශ්චාත් සීතල යුද්ධ බලවතුන්ගේ පෙරමුනෙහි එක්සත් ජනපද බටහිර යුරෝපීය සන්ධානයට යි. එය එක්සත් සෝවියට් සමාජවාදී සමූහාන්ඩුව හිරකොට තැබීමේ අත්‍යාවශ්‍ය මූලෝපායික සහකරුවෙකු ලෙස පූර්වයෙන් දැකගනු ලැබුව ද එක්සත් ජනපදය, යුරෝපය සිය ප්‍රධාන ආර්ථික තරඟකරුවා ලෙස ද ඇමරිකාවේ අධිපතිවාදී ක්‍රියාකලාපය සාක්ෂාත් කර ගැනීමේ බාධකයක් ලෙස ද දැකීමට පටන් ගෙන තිබුනි.

එක්සත් ජනපදය සමග ගෝලීය තලයේ දී තරඟ කල හැකි මිලිටරි ශක්තිය ද ඇතුලත් පොදු යුරෝපීය විදේශ පිලිවෙතක් මතුවී ඒම වලක්වාගැනීම සියල්ලටත් වඩා එක්සත් ජනපදයේ උත්සුකය වී තිබේ.

එක්සත් ජනපදය මිතුරෙකුට වඩා සතුරෙක් ය යන වැටහීම, යුරෝපය තුල අවිනිශ්චිතභාවයත්, කනස්සල්ලත් ඇතිකර තිබේ. යුරෝපය තුල සෑම රටකට ම දැන්, නව ලෝක පර්යාය තුල සිය තත්වය යලි පිරික්සා බැලීමටත් තම භූ දේශපාලනික විකල්පයන් අලුතෙන් තක්සේරු කිරීමටත් බල කෙරී ඇත. තම ඒකාබද්ධ අනුග්‍රාහකත්වය යටතේ එක්සත් යුරෝපයක් පිලිබඳව මීට පෙර තමන් අතර බෙදාගත් සිහිනය කෙරෙහි ප්‍රන්සය තව දුරටත් බැඳී සිටී යයි ජර්මනියට විශ්වාසය තැබිය හැකි ද? නැත්නම් ප්‍රන්සය ජර්මනියේ වියදමෙන් එක්සත් ජනපදය සමග ගිවිසුමක් ගසා ගනියි ද? ජර්මනිය තීරනාත්මක තෙල් සම්පත් වෙත සිය ප්‍රවිශ්ටය සුරක්ෂිත කර ගැනීම සඳහා එක්සත් ජනපදය සමග ගැටුමක් ඇතිවීමේ අවදානම සහිතව රුසියාව සමග සමහරවිට ඉරානය සමගත් සන්ධානයක් ගොඩනගාගනු ලබයි ද?

යුරෝපීය ඇමරිකානු සබඳතාවයේ ප්‍රධාන සාධකයක් බවට ඉරානය මතුව තිබේ. යුරෝපය හා ඉරානය අතර වර්ධනය වන ආර්ථික සම්බන්ධතාවලට බාධාවක් නොවන පරිදි යුරෝපය සාකච්ඡාවල යෙදී සිටින අතර න්‍යෂ්ටික බල ශක්ති පරිමාව වැඩිදියුනු කර ගැනීමේ ඉරාන සැලසුම් කෙරෙහි එක්සත් ජනපදය ආක්‍රමනකාරී ආස්ථානයක් ගෙන ඇත. ඉරානය යුරෝපීය සංගමයේ ප්‍රමුඛ වෙලඳ සහකරුවෙක් මෙන් ම ප්‍රධාන තෙල් මූලාශ්‍රය ද වේ.

ලෝක තෙල් වෙලඳපලෙහි පාලනය සහතික කර ගැනීම සඳහා යොමුව සිටින එක්සත් ජනපදය යුරෝපයේ පමනක් නොව, රුසියාවේ, චීනයේ, ජපානයේ හා ඉන්දියාවේ ද ප්‍රමුඛ සැපයුම්කරුවෙක් වන ඉරානය වෙත නෙත් යොමු කර තිබේ. ඉරානයේ සිට පකිස්තානය හරහා ඉන්දියාව වෙත දිවයනු ඇති ගෑස් නල මාර්ගයට එක්සත් ජනපද ආන්ඩුව ප්‍රසිද්ධියේ හා දරදඬු ලෙස විරෝධය පායි.

තෙල් සම්පත් ගැන විශේෂඥයකුවන මයිකල් ක්ලෙයාර් ට අනුව ''බුෂ් පරිපාලනයේ නිලධාරීන්ට ප්‍රධාන මූලෝපායික අරමුනු දෙකක් එනම් ඉරානයේ ගෑස් හා තෙල්බිම් එක්සත් ජනපද සමාගම්වල සූරාකෑමට විවෘත කර ගැනීමේ උවමනාව සහ ගෝලීය බලශක්ති වෙලඳපොලේ ඇමරිකානු තරගකරුවන් සමග ඉරානයේ වර්ධනය වන සබඳතා කෙරෙහි වන උත්සුකය යි. බුෂ් පරිපාලනයේ දෘෂ්ටි ආස්ථානයෙන් මෙම දිරවාගත නොහෙන භූ දර්ශනය වෙනස් කිරීමට ඇත්තේ එක් ප්‍රත්‍යක්ෂ හා ක්ෂනික මාවතක් පමනි - ඉරානය තුල ''පාලන තන්ත්‍ර වෙනසක්'' ක්‍රියාවට නැගීම මගින් එක්සත් ජනපදයේ මූලෝපායික අවශ්‍යතාවන්ට වඩා මිත්‍රශීලී නායකත්වයකින්, පවතින නායකත්වය විස්ථාපනය කිරීම ය.''[2]

මැද පෙරදිග තෙල් සම්පත් කරා පිවිසීම සඳහා පැවතීගෙන යන අරගලය මහා බලවතුන් ගනනාවක් අතර යුද්ධයක් බවට පහසුවෙන්ම තුඩුදිය හැක. එක්සත් ජනපදය ඉරානයට පහර දුන හොත් යුරෝපය කෙසේ ප්‍රතිචාර දක්වයි ද?

රුසියාව, ඉන්දියාව, හා චීනය කෙසේ ප්‍රතික්‍රියා කරයි ද?

ඇමරිකාවේ ගෝලීය සැලසුම් කෙරෙහි ඇති නීතිය ජාත්‍යන්තර දේශපාලනයේ ප්‍රමුඛ සාධකයක් බවට පත්ව ඇති ලෝකයක් තුල, තමත් ප්‍රහාරයක විභව ඉලක්ක බවට පත්විය හැකිබව දකගන්නා රටවල්, ඉරාකයේ ඉරනම මග හැරීමේ බලාපොරොත්තුවෙන් ඔවුන්ගේ මිලිටරි හා ආර්ථික සංවර්ධනයේ පියවර වේගවත් කරමින් සිටියි. මධ්‍යම ආසියාවේ හා පැරනි සෝවියට් සමූහාන්ඩු තුල ඇමරිකානු බලපෑම් ව්‍යාප්තවීම මගින්, වැඩි වෙමින් ඇති තර්ජනය රුසියාවට දැනේ. 2004 අවසාන භාගයේ යුක්රේනය තුල ඇමරිකානු හිතවාදී ආන්ඩුවක් ජයග්‍රහනය කරවීමට එක්සත් ජනපදය ක්‍රියා කලේ ය. කලෙක රුසියාවේ පිලිකන්නෙහි කොටසක් ලෙස සැලකූ ලිතුවේනියාවේ මෑතක පැවති නේටෝ සමුලුව තුල එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් කථාකලා ය. කලාපය තුල ඉතිරිව ඇති රුසියාවේ සමීපතමයන් අතුරින් එකක් වන අසල්වැසි බෙලාරුස්හි ආන්ඩු වෙනසකට ඇය රනකාමී ලෙස කැඳවුම් කලා ය. එක්සත් ජනපද පාලක ප්‍රභූවේ සැලකිය යුතු කොටස් රුසියාවේම ''පාලන තන්ත්‍ර වෙනසකට ''හඬ නැගූහ.

චීනය ද ඇමරිකානු ප්‍රහාරයක් ගැන බියෙන් ඉංදියාව සමග සමීප සබඳතා ගොඩනැගීමේ හැකියාව ගැන සලකාබලමින් සිටියි. එහෙත් ඉංදියාව මෙන්ම චීනය ද ඉරාන තෙල්වල අවශ්‍යතාවෙන් පෙලෙන අතර එමගින් මෙම ආසියානු බලවතුන් අතර අලුත් වටයක ගැටුම් නිර්මානය විය හැකි ය.

ඒ සමගම චීනය හා ජපානය අතර සබඳතාවය දශක ගනනාවක් තුල එහි පහලම තැනට වැටී ඇත. ජපානයේ ඉතිහාස පෙලපොත්වල අන්තර්ගතය නිමිති කොටගෙන මෑතදී ඇවිලීගිය ගැටුම් තිබියදී ම දෙරට අතර කලෙක සිට ඉතා නිශ්චිත දේශපාලනික හා මූලෝපායික අවශ්‍යතාවන් ට බැඳී ඇති ගැටුම් පවතියි. නැගෙනහිර චීන මුහුදේ තෙල්වල පාලනය හා එක්සත් ජනපදය විසින් සහයෝගය දෙනු ලබන ජපානයේ වර්ධනය වන මිලිටරිකරනය මෙයට ඇතුලත් වේ.

මෙවායින් එකක් හෝ වෙනත් යම් ගැටුම්කාරී හේතුවක් මහා බලවතුන් අතර ප්‍රධාන ගැටුමක ආරම්භක ලක්ෂය බවට පත්විය හැකි ය. ඇමරිකානු ආක්‍රමනකාරිත්වයේ පුපුරා හැලීම තම සැබෑ හා විභව තරගකරුවන්ට සාපේක්ෂව ඔවුන්ගේ ම ආර්ථික හා මිලිටරි තත්වය සුරක්ෂිත කර ගැනීමට ලෝකයේ සැම රටකම සැලසුම් කරන තත්වයක් නිර්මානය වී තිබේ. දෙවැනි ලෝක යුද්ධය අවසානයේ පටන් කිසි දිනෙක නො පැවති තරම් විශාල ප්‍රමානයක, අන්තර් අධිරාජ්‍යවාදී හා අන්තර් රාජ්‍ය අතර ගැටුම් හා ප්‍රතිරෝධයන්ගේ වෙඩිබෙහෙත් පීප්පයක් බවට ලෝකය පත්ව තිබේ.

**මතු සම්බන්ධයි.**

**සටහන්**

1. *Civilization and barberity in the 20th century Europe* [(20 වැනි සියවසෙහි යුරෝපයේ ශිෂ්ඨාචාරය හා මෘගත්වය) නිව් යෝර්ක් 1999, පිටු 176-177)]

2. ඒෂියා ටයිම්ස් - 2005 අප්‍රේල්

© www.wsws.org